EASTERN UNIVERSITY SRI LANKA

PER ARDUA AD SCIENTIAM

1981 - 2006

SILVER JUBILEE YEAR

**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය , නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**



# වාර්ෂික වාර්තාව    2012

**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය, නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

## අපගේ දර්ශනය

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය

සෞන්දර්ය ආයතනය ප්‍රමුඛතම ජනප්‍රිය ආයතනයක් බවට

පත් කිරීමයි

**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය, නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

# අපගේ මෙහෙවර

අප තොරා ගනු ලබන සෞන්දර්ය ආශ්‍රිත අංශයන්වල

දැනුම,හැකියාවන්

ලබා ගැනීමට අවස්ථාවන් ලබා දීම තුලින්

රැකියාවන් ලබාගැනීමට අවශ්‍ය

උපාධිධාරීන් , ඩිප්ලෝමාධාරීන් බිහි කිරීම,

ශ්‍රී ලංකාවේ පාරම්පරික දේවල්

රැකගැනීම, සව්බල ගැන්වීම

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ

මෙහෙවරයන් වේ.

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය, නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

# අපගේ අරමුණු

**අරමුණු 1**

ඉගැන්වීම්, පර්යේෂණ සහ දැනුම ව්‍යාප්තිය නිසි ක්‍රියාවේ යෙදවීම තුලින් විශිෂ්ඨත්වය කරා ළගා වීම.

**අරමුණු 2**

මානව සම්පත්, යටිතල ව්‍යුහය හා අනෙකුත් සම්පත් සංවර්ධනය තුලින් ආයතනීය ශක්‍යතාවය වැඩි දියුණු කිරීම

**අරමුණු 3**

පොදු සමාජ ආර්ථික හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් සඳහා වූ සේවාවන් සැපයීම.

**අරමුණු 4**

යහපාලනය ඉහල නැංවීම සහ නඩත්තුව

**කළමනාකරණය මණ්ඩල සාමාජිකයින්**

**සභාපති:** ආචාර්යකේ. කෝවින්දරාජා උප කුලපති,නැගෙනහිර විශ්වවිද්‍යාලය

**අධ්‍යක්ෂ:** ආචාර්ය කේ. ප්‍රේමකුමාර් ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය

**පීඨාධිපති:** මහාචාර්ය එම්. සෙල්වරාජා සංස්කෘතික හා කලා පීඨය,නැගෙනහිර විශ්වවිද්‍යලය

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා**

**නියෝජිත:** මහාචාර්ය එස්. මෞනගුරු

පූජ්‍ය ෆ්‍රැන්සිස් ජෝසෆ් මේරි

පූජ්‍ය ශ්‍රීමත් ස්වාමි විපුලානන්ද පී මහරාජ්

**පාලකසභා මණ්ඩල නියෝජිත:** එස් ආරුමයිනයාගම් මහතා

එම්. එම්. මහරූෆ් කරීම් මහතා

**සෙනේට්/සනාතන මණ්ඩල නියෝජිත:** එම්. නදීරා මිය

එස්. සුබ්‍රමනියම් මහතා

**භාණ්ඩාගාර නියෝජිත:** එම්. රාමමූර්ති මහතා

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ලේකම්):** ටී. විජේකුමාර් මහතා

# වාර්ෂික වාර්තාව

**03.අධ්‍යක්ෂක අධීක්ෂණය :**

**3.1 කෙටි හැඳින්වීම**

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය පීඨය ප්‍රාදේශිය සංවර්ධන සහ හින්දු සංස්කෘතික අමාත්‍යාංශය මගින් රාමක්‍රිෂ්ණන් පරම්පරාවෙන් උපත ලද නැගෙනහිර පළාතේ විද්වත් විද්‍යාව, දෙමළ සහ සෞන්දර්ය අංශයන්හි ස්වාමි විපුලානන්දයන්ගේ අනුස්මරණ කිරීම පිණිස 1982 මාර්තු මස 29 දි න ස්ථාපනය කරන ලදී.ස්වාමි විපුලානන්දයන්ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ දෙමළ අංශයේ ප්‍රථම මහචාර්වරයාය. ආරම්භයේදි මෙම සෞන්දර්ය පීඨය වසර 4 දක්වා පමණක් නැටුම් සහ සංගීතය සඳහා ඩිප්ලෝමා පමණක් පවත්වන ලදි. 1986 වරරේ සිට දේශන පුහුණුවීම් සහ තාක්‍ෂණික විශයන් නව ගොඩනැගිල්ලේ පවත්වන ලදී. (දැනට ස්වාමි විපුලානන්ද සෞන්දර්ය පීඨ ගොඩනැගිල්ල)

1986 නැගෙනහිර විශ්වවිද්‍යලය ආරම්භයේ සිට මෙම ආයතනයනැගෙනහිර විශ්වවිද්‍යලය භාර ගත යුතු යැයී නොකඩවා සිසුන් සහ ජනතාව විසින් උද්ඝෝෂණය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් පාර්ලිමේන්තු නියෝජිතයින් සහ විවිධ ආයතනවල ඉල්ලීම මත උසස් අධ්‍යාපන අමාත්‍යාංශය 2002.01.01 දින ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් පීඨය නැගෙනහිර විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධ කිරීමට ආරම්භ විය. මේඅතර ස්වාමි විපුලානන්ද නැටුම් හා සංගීත පීඨය සංස්කෘතික අමාත්‍යාංශය මගින් උත්සවාකාරයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය 2001 අප්‍රේල් මස 20 වන දින භාරදෙන ලදී. මෙතැන් පටන් සිසුන් උපාධි විෂයමාලාවන්ද අනුමත කල අතර නැගෙනහිර විශ්ව විද්‍යාලය මගින් උපාධි පිරි නමන ලදී. ඉන් පසු ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය ලෙස නම් කරන ලදී.

අනුමැතිය ලත් ආයතයක් ලෙස සංගීතය සහ නැටුම් ඩිප්ලෝමා ලබාගත් සිසුන්හට ස්වාමි විපුලානන්ද සෞන්දර්ය විද්‍යාලයේ උපාධීය හැදෑරීම සඳහා වසර දෙකක් ලබා දුන් අතර ගුරුවරුන් සහ අනධ්‍යන කාර්යමණ්ඩලය සඳහා වැටුප් ලබා දෙන ලදී. 2001 වසරේසිට 2005 වසර දක්වා අධීක්ෂණය කරන ලදී. පහත සඳහන් පුද්ගලයින් විශ්ව විද්‍යාලයේ ප්‍රධානින් ලෙස පත් කරන ලදී.

- මහාචාර්ය ආම්මන්කිලි මුරුගදාස්

පීඨධිපති, සෞන්දර්ය පීඨය(2001-2002)

- මහාචාර්ය සී මෞනගුරු

සභාපති, තාක්‍ෂණික කලාව (2002-2004)

- පී.සුගුමාර් මහතා

සභාපති, තාක්‍ෂණ කලාව (2004 - 2005)

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය 1978 වර්ෂයේ 16 වන විශ්වවිද්‍යාල පනත යටතේ 24B යන වගන්තිය යටතේ 2005.03.14 වන දින සම්මත කල අතර 2005.06 .03 වන දින 1395/22 විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර අනුමත කරන ලදී. ප්‍රථම වශයෙන් 2005 සහ 2006

වසර සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් බඳවා ගන්නා ලදී. ස්වාමි විපුලානන්ද සෞන්දර්ය විද්‍යාලයේ සියලුම ගුරුවරුන් අනධ්‍යන කාර්ය මණ්ඩලයත් 2005 මැයි මස සිට නැගෙනහිර විශ්ව විද්‍යාල සමග ඒකාබද්ධ කරන ලදී. නියමිත ගුරුවරුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ලෙස ද අනිකුත් ගුරුවරුන් කථිකාචාර්යවරුන් ලෙසද පුහුණු ගුරුවරුන් වශයෙන්ද අනුයුක්ත කරන ලදී. පහත සඳහන් විෂයන් හැදෑරීම සඳහා අවසර දී ඇත

- කර්නාටක සංගීතය
- නැටුම්, නාට්‍ය හා රංගකලාව
- කැටයම් හා තාක්ෂණ කලාව

ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂක ලෙස 2005-03-14 වන දින සිට බාලාම්බිගයි රාජේස්වරන් මහත්මිය MA.(Music), M.Phil (India) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කරන ලදී.

### 3.2පිහිටා ඇති ස්ථානය

මඩකලපුව නගරයේ සිට කි.මීටර් 3 දුරින් මඩකලපුව - කල්මුණෝ ප්‍රධාන මාවතේ රාමක්‍රිෂ්ණපුරම් නොච්චිමුනේ හී මෙම ආයතනය පිහිටා ඇත.

2005 සහ 2006 අධ්‍යන වසර සඳහා ප්‍රථම සිසුන් කණ්ඩායම නාට්‍ය හා රංග කැටයම් කලාව යන විෂයන් සඳහා බඳවා ගන්නා ලදී. 2006/07 වන අධ්‍යාපන වර්ෂය සිට නාට්‍ය හා රංග කැටයම් කලාව යන විෂයන්ද ආරම්භ කරන ලදී.

- කර්නාටක සංගීතය
- නැටුම්
- නාට්‍ය හා රංගකලාව
- කැටයම් හා තාක්ෂණ කලාව
-

2011 වසරේදි මුළු සිසුන් සංඛ්‍යාව 796 කි. 2010 සහ 2011 වසර සඳහා සිසුන් 221 බඳවා ගන්නා ලදී. අංශ වලට බඳවා ගත් සිසුන් ගණන පහත සඳහන් වේ.

- කර්නාටක සංගීතය- 77
- නැටුම්, - 43
- නාට්‍ය හා රංගකලාව - 50
- කැටයම් හා තාක්ෂණ කලාව - 52

### 3.3ජයග්‍රහණයන්

**3.3.1**HETC ව්‍යාපෘතියයටතේවිශ්වවිද්‍යාල සංවර්ධනය අරමුදල වෙත භාර දෙන ලද යෝජනා පත්‍රයට අනුව ආධාර වශයෙන් රු. මිලියන 15 ක් පහත ව්‍යාපෘතිසඳහා අප ආයතනය වෙත ප්‍රදානය කරන ලදී.

- තොරතුරු තාක්ෂණය දියුණු කිරීම සඳහා
- ඉංග්‍රීසි භාෂාව දියුණු කිරීමසඳහා
- ජීවන කුසලතා දියුණු කිරීමසඳහා
- සමාජ සාමූහිකත්වය/ එකමුතු බව දියුණු කිරීම

### 3.3.2 <u>විශිෂ්ඨතා ප්‍රදානයන්</u>

නිර්මාණශීලී කුසලතා සඳහා වූ උසස් අධ්‍යයන සම්මාන උළෙල 2012 හි දමිළ මාධ්‍ය තරඟාවලියෙහි කුසලතා සම්මාන 15ක් දිනා ගැනීමට නැගෙනහිර විශ්ව විද්‍යාලය සමත් විය. ඉන් ප්‍රථම ස්ථාන සම්මාන 4ක් ද අනු ශූරතා සම්මාන 3ක් දතෙවන ස්ථාන සම්මාන 3ක් ද ජයග්‍රහණය කරමින් දමිළ මාධ්‍ය තරඟාවලියේ සමස්ත ශූරතාවය නැගෙනහිර විශ්ව විද්‍යාලය වෙත අත්පත් කර දීමට ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය නොමද සහයෝගයක් ලබා දෙන ලදී.

### 3.3.3 <u>සංස්කෘතික විවිධත්වය තුලින් එකමුතු බව</u>

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය සමාජ සාමුහිකත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් රාශියක් සංවිධානය කරනු ලබයි. රට පුරා සංවිධානය කරනු ලබන විවිධ නර්තන හා අනෙකුත් සංස්කෘතික වැඩසටහන් සඳහා අප සිසු දරු දැරියන්ගේ නොමද සහභාගීත්වයක් ලබා දෙමින් සමාජ එකමුතු බව ප්‍රවර්ධනය කිරීම සඳහා සිය දායකත්වය සැපයීමට අප ආයතනයට හැකියාව ලැබී ඇත.

### 3.3.4 <u>සංස්කෘතික උරුමයන් සංරක්ෂණය සහ ප්‍රවර්ධනය</u>

අවුරුදු විසිපහකටත් වැඩි කාලයක් පුරාවට සිය කීර්තිනාමය පතුරවමින් කලාපයීය හා ජාතික සංස්කෘතික උරුමයන් රැක ගැනීමේ හා ප්‍රවර්ධනය කිරීමෙහි කාර්යයට උර දීමටත් ජන හා සාම්ප්‍රදායික කලා සංස්කෘතිය සංරක්ෂණය කිරීම සිය ඉලක්කය කොට අප ආයතනය නිරතුරුවම කටයුතු කරයි.

### 3.3.5 <u>සංස්කෘතික වැඩසටහන් සංවිධානය තුලින් විවිධ ප්‍රජාවන් අතර සාමූහිකත්වය වැඩි දියුණු කිරීම</u>

විවිධ මැති ඇමතිවරුන් සහ ප්‍රභූ මට්ටමේ පුද්ගලයන්ගේ මඩකලපු දිස්ත්‍රික් සංචාරයන් සෑම අවස්ථාවනදීම පාහේ අප ආයතනයේ සිසු දරු දැරියන් විසින් පිළිගැනීමේ නර්තන හා අනෙකුත් සංස්කෘතික අංගයන් ඉදිරිපත් කරන අතර ඒ තුලින් විවිධ ප්‍රජාවන් අතර සාමූහිකත්වය වැඩි දියුණු කිරීමට සිය දායකත්යව සපයයි.

### 3.3.6 මහින්ද චින්තන ඉදිරි දැක්ම සඳහා වූ දායකත්වය

අන්‍යෝන්‍ය සුහදත්වය හා නිදහස අරමුණු කරගත් මහින්ද චින්තන වැඩපිළිවෙල යටතේ වූ "දැයට කිරුළ" හා "කලා පොල" ප්‍රදර්ශනයන්හි සහ රට පුරා පැවති අනෙකුත් සංස්කෘතික උත්සවයන් සඳහා අප සිසු දරු දැරියන්ගේ නොමද සහභාගීත්වය ලබා දෙන ලදී.

### 3.3.7 ජනවාර්ගික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම උදෙසා සංස්කෘතික සහ-බද්ධතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජනවාර්ගික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කරනු ලැබූ "ජන කරළිය" හා එකමුතු සංස්කෘතික වැඩසටහන් සඳහා (නර්තන හා ජන සංගීත අංශ වලින්) කොළඹ දෘශ්‍ය හා රංග කලා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් සමඟ ඒකාබද්ධව වැඩසටහන් සංවිධානය කොට ඉදිරිපත් කිරීමට අප සිසු දරු දැරියන් සමත් විය.

### 3.3.8 අතිගරු ජනාධිපතිතුමන්ගේ දිස්ත්‍රික් ආගමනයන්හි පිළිගැනීම

අප ආයතනයේ සංස්තෘතික වාද්‍ය කණ්ඩායම අතිගරු ජනාධිපතිතුමන්ගේ දිස්ත්‍රික් සංචාරයන් සියල්ලෙහිම පාහේ පිළිගැනීමේ පෙරෙට්ටුව නියෝජනය කරයි.

### 3.3.9 විවිධ ආගමික උත්සවයන් සඳහා වූ සංස්කෘතික වැඩසටහන් සංවිධානය කිරීම

අප සිසු දරු දැරියන් විසින් විවිධ ආගමික උත්සවයන් මුල් කරගත් සංස්කෘතික වැඩසටහන් ආයතනය තුලත් ඇතැම් අවස්ථා වල ආයතනයෙන් පිටතත් සංවිධානය කරනු ලබයි

### 3.3.10 වැඩමුළු පැවැත්වීම

එක් එක් විෂය ක්ෂේත්‍රයන්ට අදාල විශිෂ්ඨයන්/විශාරදයන් ගෙන්වා සිසු දරු දැරියන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසා වැඩමුළු ගණනාවක් අප ආයතනය තුල සංවිධානය කරන ලදී

## 3.4 අසමර්ථ වීම් සහ යුක්ති සාධනයන්

ආයතනය සතුව අක්කර 6 ඇතත් එය ආයතනය විශාල කිරීමට හෝ සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් නැත.

සිසුන් 200 සඳහා කාන්තා නේවාසිකාගාරයක් වන සැලැස්ම යෝජනා කර ඇතත් අමාත්‍යාශයෙන් අනුමැතිය ලැබී නැත. ආයතනයේ යටිතල පහසුකම් ප්‍රමාණවත් නැත. නව ක්‍රියාකාරි සැලැස්ම(Master plan)සඳහා යෝජනා ආයතනය විසින් සකස් කරගෙන යනු ලබයි.

### 3.5 අනාගත සැලැසුම්

දැනට පවත්නා අධ්‍යන දෙපාර්තමේන්තු එක් එක් විෂය ක්ෂේත්‍රයන්ට අදාල පීඨ බවට පත් කිරීමට අප අපේක්ෂා කරයි.

අ) කර්නාටක සංගීත පීඨය

ආ) නැටුම් පීඨය

ඉ) නාට්‍ය හා රංගකලා පීඨය

ඊ) කැටයම් හා තාක්‍ෂණ කලා පීඨය

කැටයම් හා තාක්‍ෂණ කලා දෙපාර්තමේන්තුව මගින් එම උපාධි පාඨමාලාවට අනුබද්ධව විශේෂ උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කොට ඇත.සියළු පාඨමාලාවල විෂය නිර්දේශයන් පුනරීක්‍ෂණය කිරීමටද කටයුතු සැලසුම් කොට ඇත.

**04 සම්පත් සහ සිසුන් පිළිබඳව විස්තර 2012-12-31 වන දිනට අදාල වන පරිදි**

| අංශය | පාඨමාලාව | මුළු සිසුන් සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලයමුළු සංඛ්‍යාව | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයසංඛ්‍යාව | මුළු පරිපාලන කාර්ය මණ්ඩලයසංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සංගීතය | තාක්‍ෂණ කලා උපාධිධාරී (සංගීතය) | 279 | 13 | 01 | |
| නැටුම් හා නාට්‍ය රංග කලාව | තාක්‍ෂණ කලා උපාධිධාරී (නැටුම් ) | 171 | 05 | 01* | |
| | තාක්‍ෂණ කලා උපාධිධාරී (නාට්‍ය රංග කලාව) | 202 | 05 | - | |
| කැටයම් කලාව | තාක්‍ෂණ කලා උපාධිධාරී (කැටයම් කලාව) | 204 | 02 | - | |
| පුස්තකාලය | | - | 01 | 02+01* | |
| පරිපාලන | | - | - | 10+01* | 03 |
| මූල්‍ය | | - | - | 05 | 01 |
| **එකතුව** | | **856** | **26** | **21** | **04** |

ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල අනුපාතය ගත් කල නැටුම් හා නාට්‍ය රංග කලාව සහ කැටයම් කලාව යන අංශ සඳහා වූ කාර්ය මණ්ඩල ප්‍රතිශතය ඉතා අවමය. ඒ සඳහා වූ පුරප්පාඩු වැඩි කිරීමක් සිදු කල යුතුය. එසේම සියළු අධ්‍යන දෙපාර්තමේන්තු සඳහා තවමත් ලිපිකරු හා පරිගණක යෙදුම් සහකරුවන් අනුයුක්ත කොට නැති අතර ඒ සඳහාද පුරප්පාඩු වැඩි කිරීමක් සිදු කල යුතුය.

| 05 දේශිය සිසුන් පිළිබඳ විස්තර 2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අංශය | පාඨමාලාව | භාෂාව | 2009 ඇතුලත් වූ මු ළු සිසුන් ගණන | 2010 ඇතුලත් වූ මු ළු සිසුන් ගණන | 2011 ඇතුලත් වූ මු ළු සිසුන් ගණන | 2012 ඇතුලත් වූ මු ළු සිසුන් ගණන | මුළුසිසුන් ගණන 2012 | උපාධි ලාභී සිසුන් ගණන 2012 |
| සංගීතය | තාක්ෂණ කලා උපාධිධාරී (සංගීතය) | දමිළ | 46 | 79 | 77 | 77 | 279 | 44 |
| තාක්ෂණකලා උපාධිධාරී නාට්‍ය හා රංගනය | තාක්ෂණ කලා උපාධිධාරී (නැටුම්) | | 34 | 51 | 43 | 43 | 171 | 20 |
| | තාක්ෂණ කලා උපාධිධාරී (නාට්‍ය රංගනය) | | 48 | 54 | 50 | 50 | 202 | 46 |
| කැටයම් කලාව | තාක්ෂණ කලා උපාධිධාරී ( කැටයම් කලාව) | | 50 | 50 | 52 | 52 | 204 | 06 |
| | **එකතුව** | | **178** | **234** | **222** | **222** | **856** | **116** |

තාක්ෂණ කලා උපාධි (සංගීතය) පාඨමාලාව සඳහා වාර්ෂික සිසුන් ඇතුලත් කර ගැනීම සිසුන් 80 වූ අතර අනෙකුත් පාඨමාලා සඳහා වාර්ෂික වෙන් කිරීම සිසුන් 50 බැගින් විය. තාක්ෂණ කලා උපාධිධාරී (නැටුම්) පාඨමාලාව හැරුණු කොට අනෙක් පාඨමාලා සියල්ල සඳහා අනුමත උපරිම සිසුන් ගණන බඳවා ගැනීමට හැකි විය.

| 06 උපාධිදාරී සිසුන් පිළිබඳ විස්තර | | | | | |
|---|---|---|---|---|---|
| අංශය | පාඨමාලාව | භාෂාව | 2010 | 2011 | 2012 |
| සංගීතය | තාක්ෂණ කලා උපාධිධාරී (සංගීතය) | දමිළ | 27 | 44 | 24 |
| තාක්ෂණකලා උපාධිධාරී නාට්‍ය හා රංගනය | තාක්ෂණ කලා උපාධිධාරී (නැටුම්) | | 18 | 20 | 24 |
| | තාක්ෂණ කලා උපාධිධාරී (නාට්‍ය රංගනය) | | - | 46 | 47 |
| කැටයම් කලාව | තාක්ෂණ කලා උපාධිධාරී ( කැටයම් කලාව) | | - | 06 | 37 |
| | **එකතුව** | | **45** | **116** | **134** |

ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම 2005/2006 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුලත් කරගන්නා ලද අතර,එම සිසුන් සංගීතය සහ නර්තනය යන පාඨමාලාවන්ට අදාලව 2010 වසරේ සිය උපාධි ලබාගන්නා ලදී. නාට්‍ය හා රංගනය සහ කැටයම් කලාව පාඨමාලා 2006/2007 අධ්‍යයන වර්ෂයේදී හඳුන්වා දුන් අතර එම පාඨමාලා යටතේ සිසුන් 2011 වසරේ සිය උපාධි ලබාගන්නා ලදී.

| 07 අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු 31-12-2012වන දිනට අදාල වන පරිදි | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අංශය | පාඨමාලාව | භාෂාව මගින් | ජ්‍යේෂ්ඨ මහචාර්ය | මහාචාර්ය | ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස කාලය) | සහකාර පුස්තකාලාධිපති | උපදේශක |
| සංගීතය | තාක්ෂණ කලා උපාධිධාරී (සංගීතය) | දමිළ | - | - | - | - | 14 | - | |
| තාක්ෂණකලා සහ නාට්‍ය හා රංගනය | තාක්ෂණ කලා උපාධිධාරී (නැටුම්) | | - | - | 01 | - | 07 | - | |
| | තාක්ෂණ කලා උපාධිධාරී (නාට්‍ය රංගනය) | | - | - | - | - | 08 | - | |
| කැටයම් කලාව | තාක්ෂණ කලා උපාධිධාරී (කැටයම් කලාව) | | - | - | - | - | 06 | - | |
| පුස්තකාලය | | | - | - | - | - | - | - | |
| පරිඝනක අංශය | | | | | | | - | 01 | 01 |
| | **එකතුව** | | **-** | **-** | **01** | **-** | **35** | **01** | **01** |

2005 ආයතනය ආරම්භයේ උපදේශකවරුන් 04 ක් සහ කථිකාචාර්යවරුන්(පරිවාස කාල) 20 සේවයේ නියුක්තව සිටින ලදී. ඉන් උපදේශකවරුන් සියල්ල කථිකාචාර්යවරුන් ලෙස උස්ස වීම් ලැබීමත් සමඟ 2012 වසරේ මුළු කථිකාචාර්යවරුන් සංඛ්‍යාව 35 දක්වා ඉහල යන ලදී.

| 08 අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර 2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | | |
|---|---|---|---|---|
| අංශය | විධායක නිලධාරී | තාක්ෂණ නිලධාරී | ලිපිකරු හා සම නිලධාරී | සුළු සේවක |
| සංගීතය | - | - | 01 | - |
| තාක්ෂණකලා උපාධිධාරී නාට්‍ය හා රංගනය | - | - | 01 | - |
| කැටයම් කලාව | - | - | - | - |
| පුස්තකාලය | | | 02 | 01 |
| මූල්‍ය | 01 | - | 04 | 01 |
| පරිපාලන | 03 | 02 | 08 | 05 |
| **එකතුව** | **04** | **02** | **16** | **07** |

අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පුරප්පාඩු ඉතා සුළු ප්‍රමාණයක් පවතින අතර අදාල පුරප්පාඩු පිරවීමට සැලසුම් කොට ඇත.

| 09 පර්යේෂණ, නවෝත්පාදන, මුද්‍රිත පොත් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර<br>2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | |
|---|---|---|---|
| කාරණය | ප්‍රකාශන නිකුත්නරන ලද | අලෙවි කරන ලද | ඉදිරිපත් කරන ලද |
| පර්යේෂණ ගණාන | - | - | - |
| නවෝත්පාදන | 01 | - | 01 |
| සඟරා | 01 | - | - |
| පොත් | 03 | - | - |
| ලිපි සහ පරිච්ඡේද | - | - | - |
| වෙනත් | | | |
| **එකතුව** | **05** | **-** | **01** |

මුළුඅධ්‍යයන කාර්යමණ්ඩලය 32 දෙනකු අතරින් 29 දෙනෙකු පරිවාස කාලය කථිකාචාර්යවරුන් වන අතර ඔවුන් තම පර්යේෂණ උසස් අධ්‍යාපන (Ph.D/M. Phil පාඨමාලා වලට අදාල පර්යේෂණ කටයුතු වල නියැලෙමින් සිටී. පරිවාස කාල කථිකාචාර්යවරුන් 07 දෙනකු සිය P.hD පාඨමාලා හදාරන අතර එක් සහකාර පුස්තකාලාධිපති වරයකු M. Phil පාඨමාලාවක් හදාරමින් සිටී.

| 10 වැඩසටහන්,සම්මන්ත්‍රන සහ වැඩමුළුපිළිබඳ විස්තර 2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | |
|---|---|---|---|
| කාරණය | හදාරන ලද | නිම කරන ලද | ඉදිරිපත් කරන ලද |
| පශ්චාත් උපාධි පාඨමාලා ගණාන | - | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ගණාන | - | - | - |
| උපාධි පාඨමාලා ගණාන | 07 | 07 | 07 |
| ඩිප්ලෝමා පාඨමාලා ගනන | - | - | - |
| සහතික පත්‍ර පාඨමාලා | - | | - |
| වෙනත් | - | | - |
| **එකතුව** | **07** | **07** | **07** |

| 11 ලබාගත් සම්මාන පිළිබඳ විස්තර 2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | |
|---|---|---|---|
| කාරණය | සම්මාන ගණන | අධ්‍යයන නිලධරයින් ගණන | සිසුන් ගණන |
| දේශිය සම්මාන | - | - | - |
| ජාතික සම්මාන | | - | 02 |
| ජාත්‍යන්තර සම්මාන | 01 | 01 | - |
| වෙනත් | - | - | - |
| **එකතුව** | **01** | **01** | **02** |

කැටයම් හා තාක්‍ෂණ කලා අංශයේ එක් කථිකාචාර්යවරයෙකු ජාත්‍යන්තර සම්මානයක් හිමි කරගන්නා ලද අතර ඔහුගේ චිත්‍ර 2012 ඉතාලි - කොළඹ තානාපති කාර්යාලය විසින් පවත්වනු ලැබූජාතික මට්ටමේ ප්‍රදර්ශණයක් සඳහා (දැයට කිරුළ, කලා පොළ ප්‍රදර්ශණය)ඉදිරිපත් කරන ලදී.

| 12 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 2012-12-31 දිනට අදාල වන පරිදි | | |
|---|---|---|
| කාරණය | 2011 රු. | 2012 රු. |
| පුද්ගල වේතන | 26,875,134.61 | 32873382.66 |
| ගමන් වියදම් | 318,808.00 | 211,933.00 |
| සැපයුම් | 3,266,192.90 | 3,354,262.57 |
| නඩත්තු | 188,644.57 | 1,045,978.52 |
| ගිවිසුම්කර සේවා | 8,378,590.86 | 11,137,619.11 |
| වෙනත් | 1,491,013.36 | 2,681,065.59 |
| **එකතුව** | **40,518,384.30** | **51,304,241.45** |

සැපයම් වියදම් සහ ගිවිසුම්කර සේවා සඳහා වූ වියදම් ඉහලයාම අනුපිළිවෙලින් නව සිසුන් ඇතුළත් කර ගැනීම ඉහල යාම සහආරක්‍ෂක සේවාවන් වෙනත් ආයතනයක් හරහා ලබා ගැනීම සඳහා වූවකි.

| 13 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 2012-12-31 දිනට අදාල වන පරිදි | | |
|---|---|---|
| කාරණය | 2011 රු. | 2012 රු. |
| ගෘහ භාණ්ඩ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම | 9,115,318.73 | 1,882,896.00 |
| යන්ත්‍ර මිලදී ගැනීම | - | 75,376.48 |
| ගොඩනැගිලි සහ සැලසුම් සඳහා | 3,466,749.38 | 6,034,606.36 |
| වෙනත් | 1,195,813.23 | - |
| **එකතුව** | **13,777,881.34** | **7,992,878.84** |

වැඩිනව සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කර ගැනීම නිසා එම ඉහලයාමට සාපේක්ෂව ගෘහ භාණ්ඩ හා අනෙකුත් උපකරණ මිලදී ගැනීමටත් ගොඩනැගිලි සහ සැලසුම් සඳහා වූත්වියදම් ඉහල යන ලදී

| 14 ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර (දේශීය/විදේශ ආධාර) 2012-12-31 දිනට අදාල වන පරිදි | | | | | |
|---|---|---|---|---|---|
| නම සහ විස්තර | ණය/ප්‍රතිපාදන | ණය ලබා දුන් ආයතනය | TCE රු. | RFA රු. | DF රු. |
| HECT ව්‍යාපෘතිය | ප්‍රතිපාදන | ලෝක බැංකුව | 15 මිලියන | - | - |
| **එකතුව** | **-** | **-** | **15 මිලියන** | **-** | **-** |

ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සඳහා ලෝක බැංකු ආධාර මත (HECT ව්‍යාපෘතිය යටතේ) ලැබුණු රුපියල් මිලියන 15ක මුදල තොරතුරු තාක්ෂණය,ඉංග්‍රීසි භාෂාව මෘදුකාංග සහ සමාජ සමගිය සංවර්ධනය යනාදී කාර්යයන් ඉටු කිරීම සඳහා ලබා දෙන ලදී.

| 15 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර ( දේශීය /විදේශ ආධාර)2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | | | |
|---|---|---|---|---|---|
| නම | TCR රු. | 2011වියදම් රු. | 2012 වියදම් රු. | සමුච්චිතවියදම් 2012-12-31 දිනට රු. | භෞතික සංවර්ධන වියදම් % |
| HECT ව්‍යාපෘතිය | 15 මිලියන | - | - | - | - |
| **එකතුව** | **15 මිලියන** | - | **-** | **-** | **-** |

වෙන් කරන ලද ආධාර මුදල් ප්‍රමාද වී ලැබුනු බැවින් අවශ්‍ය කටයුතු සඳහා එම මුදල් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය.

| 16 මූල්‍යසංවර්ධනය (වියදම්) පිළිබඳ විස්තර 2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | |
|---|---|---|---|
| කාරණය | 2012 සඳහා වෙන් කිරීම් රු. | 2012 සඳහා වියදම් රු. | ඉතිරිකිරීම්/අතිරික්තය රු. |
| පුනරාවර්තනවියදම් ව්‍යාපෘති | 57,500,000.00 | 51,304,241.45 | 6,195,758.55 ඉතිරිකිරීම් |
| ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති | 18,299,000.00 | 7,992,878.84 | 10,207,121.16ඉතිරිකිරීම් |
| ව්‍යාපෘති - දේශිය ආධාර | - | - | - |
| ව්‍යාපෘති - විදේශ ආධාර | - | - | - |
| **එකතුව** | **75,799,000.00** | **59,297,120.29** | **16,402,879.71** |

ඇතුලත් කර ගන්නා ලද සිසුන් සංඛ්‍යාව ඉහල යාම හේතුවෙන් ඒ හා සරිලන පුනරාවර්තන වියදම් ව්‍යාපෘති සඳහා මුදල් වැය කිරීමට සිදුවිය.

| 17 මූල්‍ය සංවර්ධනය පිළිබඳ විස්තර (ආදායම්)2012-12-31 වන දිනට අදාල වන පරිදි | | | |
|---|---|---|---|
| ආදායම් මූලාශ්‍රය | 2012 සඳහා වෙන් කිරීම් රු. | 2012 සඳහා ලැබීම් රු. | ඌනතාව/ අතිරික්තයරු. |
| උපාධි පාඨමාලා | 895,000.00 | 212,150.00 | 682,850.00 |
| පශ්චාත් උපාධි පාඨමාලා | - | - | - |
| උපදේශක සේවා | - | - | - |
| වෙනත් | 1,120,000.00 | 147,508.52 | 942,492.00 |
| **එකතුව** | **2,015,000.00** | **359,658.52** | **1,625,342.00** |

සටහන- ආයතයේ මුදල් අයකරන පාඨමාලා කිසිවක් ක්‍රියාත්මක නොවේ.සිසුන් ලියාපදිංචි කර ගැනීම් වෙනුවෙන් පමණක් දැනට මුදල් ලැබේ.

| 18 මූල්‍ය ප්‍රතිපල අධ්‍යනය 2012-12-31 වන දිනට අදාල වන පරිදි | | |
|---|---|---|
| කාරණය | සූත්‍රය | එක් සිසුවෙකු සඳහා වියදම රු. |
| එක් සිසුවෙකු සඳහා වන පුනරාවර්තන වියදම් | පුනරාවර්තන වියදම් / සිසුන් ගණන | 72,236.18 |
| එක් සිසුවෙකු සඳහා වන ප්‍රාග්ධන වියදම් | ප්‍රාග්ධන වියදම් / සිසුන් ගණන | 22,864.32 |
| | **එකතුව** | **95,100.50** |

පසුගිය වසරට වඩා මෙම වසරේඇතුලත් කරගන්නා ලද සිසුන් සංඛ්‍යාව ඉහල ගිය බැවින් එක් සිසුවෙකු සඳහා දැරිය යුතු වියදමඅවමවී ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனதுஇல / My No. : ඊඑන්/බීටී/බී/එස්වීඅයිඒඑස්/එෆ්එස්/2012
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2013 ජුනි 19 දින.

අධ්‍යක්ෂ ,
සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය
නැගෙනහිර විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකාව

**සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ ( SVIAS ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (2) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (අ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ ( SVIAS ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ (111) වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය හා මුදල් පනතේ 13 (7) (අ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.39,226,933 ක් වූ ස්ථාවර වත්කම් භෞතික පරීක්ෂණය මත පදනම් කර ගත් අගය වෙනුවට පොත් අගය මත පදනම්ව ගිණුම්ගත කර තිබුණි. .

(ආ) ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ප්‍රත්‍යාගණනය කර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.57,500,000 ක් වූ පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු රු.3,573,872 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.42,314,778 ක රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු එම වර්ෂයේ රු.1,934,894 ක ඌනතාවයක් වුයෙන් රු.5,508,766 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් දැක්වුණි. පුනරාවර්තන ප්‍රදානය වැඩිවීම එයට හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විභාග ප්‍රතිඵල

ලබාගත හැකි වූ තොරතුරු අනුව පවත්වන ලද විභාග වලදී උපාධි ලාභීන්ගේ කාර්ය සාධනය පහත දැක්වේ.

| පීඨය | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමර්ථ වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| සංගීත | 45 | 44 |
| නැටුම් | 56 | 54 |
| නාට්‍ය හා රංගන | 90 | 82 |
| දෘශ්‍ය හා තාක්ෂණික කලාව | 06 | 06 |
| එකතුව | 197 | 186 |

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

ආයතනයේ පාඨමාලා 4 ක් සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 796 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.54,285,237 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.68,198 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඒක ශිෂ්‍ය පිරිවැය රු.8,334 කින් වැඩිවී තිබුණි.

(ඇ) මහපොළ සහ ශිෂ්‍යාධාර

සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යයින් 583 ක් සඳහා ශිෂ්‍යාධාර ලෙස රු.7,825,200 ක්ද ශිෂ්‍යයින් 55 ක් සඳහා මහපොළ ආධාර ලෙස රු.472,500 ක්ද ගෙවා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසු ගිය වර්ෂය තුළ විවිධ සැපයුම්කරුවන් නමින් ලියන ලද රු.3,622,315 ක්වූ චෙක්පත් 14 ක් ආයතනයේ නිලධාරියකු විසින් මඩකලපුවේ පුද්ගලික බැංකු ශාඛාවක පවත්වාගෙන යන ඔහුගේ බැංකු ගිණුම මගින් වංචනිකව මුදල් කර ගෙන තිබුණි.

(ආ) බිම කාපට් , චිත්‍රාධාර ( easels ) , මූර්ති චක්‍ර ( Sculpture Wheels ) සහ බන්ක් බෙඩ්ස් (Bunk beds ) රු.4,183,728 ක පිරිවැයකට පසුගිය වර්ෂය තුළ ආයතනය විසින් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බිම කාපට් වර්ග අඩියකට රු.480 බැගින් පවතින වෙළඳපොළ මිලට වඩා ඉහළ රේටයකට ගෙවා තිබුණි. කෙසේ වුවද මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෙයට සමාන වර්ගයේ කාපට් වර්ග අඩියක් රු.60 බැගින් මිලදී ගෙන තිබුණි.

(ii) තෝරාගත් සැපයුම්කරුවන් 7 දෙනෙකුට ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාර විසින් ටෙන්ඩර් ලියකියවිලි යවා තිබුණද කාත්තන්කුඩි හි වූ එයින් එක් සැපයුම්කරුවකු ව්‍යාජ නමකින් වූ අතර දෙවැනි සැපයුම් කාර ස්ථානය වාහන සේවා මධ්‍යස්ථානයක් හා වෙල්ඩින් ගරාජයක් විය. මඩකලපුවෙහි තවත් සැපයුම්කාර ස්ථානයක් වෙල්ඩින් වැඩපොළක් විය.

(iii) චිත්‍රාධාර ( easels ) 70 ක් එකක් රු.14,000 බැගින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව පවතින වෙළඳපොළ වටිනාකම එකක් රු.7,000 ක් විය. මේ සම්බන්ධයෙන් රු.490,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) පරිසර නිලධාරි, ප්‍රාදේශීය ලේකම් හා අර්යම්පති ප්‍රාදේශීය සභා වාර්තාවන්ට අනුව චිත්‍රාධාර මිලදී ගනු ලැබූ ස්ථානය වෙල්ඩින් ගරාජයක් විය.

(v) ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාර විසින් තෝරාගත් සැපයුම්කරුවන් 7 දෙනකුට ටෙන්ඩර් ලියකියවිලි යවා තිබුණද , පළාත් පාලන ආයතනයේ ආදායම් පරීක්ෂක සමඟ කරන ලද සෘජු පරීක්ෂාවට අනුව ලංසුකරුවන් 5 දෙනෙකු වෙල්ඩින් වැඩපොළවල් වූ අතර එක් වෙල්ඩින් වැඩපොළක කිසිදු ලී භාණ්ඩයක් නිෂ්පාදනය කර නොතිබුණි.

(vi) 2008 වර්ෂයේදී වසා දමන ලද මොරටුවේ පුද්ගලික වෙළඳ සැලකින් රු.1,230,000 කට "බන්ක් බෙඩ්ස් " 30 ක් මිලදී ගෙන තිබුණු අතර වර්ෂ දෙකකට වැඩි කාලයක් නව ව්‍යාපාර ආයතනයක් ( රෙදි සම්බන්ධ ) එම ලිපිනයේ ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(vii) "බන්ක් බෙඩ්ස් " මිලදී ගැනීම සනාථ කිරීම සඳහා ව්‍යාජ බිල්පත් භාවිතා කර තිබුණි.

(viii) එකක් රු.41,000 බැගින් "බන්ක් බෙඩ්ස් " 30 මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව පවතින වෙළඳපල වටිනාකම රු.30,000 ක් පමණක් විය. මේ සම්බන්ධයෙන් රු.330,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ix) මූර්ති චක්‍ර මිලදී ගැනීම සඳහා විවිධ පිරිවිතරයන් සැපයුම්කරුවන්ට යවා තිබුණි.

(x) සැපයුම්කරු විසින් එකක් රු.21,500 ක් වූ ඉහළ රේටයකට මුර්ති වක්‍ර සපයා තිබුණි. එහෙත් මුර්ති වක්‍ර එකක පවත්නා වෙළඳපොළ වටිනාකම රු.10,000 ක් විය. මේ සම්බන්ධයෙන් රු.575,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) ආයතනය විසින් තථ්‍ය අවශ්‍යතාවය හා අව්‍යාජත්වය සැලකිල්ලට ගැනීමෙන් තොරව රු.මිලියන 1.27 ක පිරිවැයකට ව්‍යාජ / අනුරූප ටෝනර් 91 ක් මිලදී ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ටෝනර් වර්ෂ 1 කට වැඩි කාලයක් ආයතනයේ ගබඩාවේ නිෂ්කාර්යව තිබුණි.

(ඇ) මිලදී ගන්නා ලද පහත දැක්වෙන පාරිභෝජ්‍ය විෂයයන් උපයෝජනය කිරීමෙන් තොරව ගබඩාවේ තබා තිබුණි.

| විෂයය | ප්‍රමාණය |
|---|---|
| මදුරු දඟර | පැකට් 465 |
| ලයිසෝල් | බෝතල් 662 |
| හාපික් | බෝතල් 944 |
| හැන්ඩ් වොෂ් | බෝතල් 107 |
| මදුරු දියර නැවත පිරවීම් ( Mosquito liquid refill ) | බෝතල් 90 |
| එයාර් ෆෙෂ්නර් | බෝතල් 124 |
| DVD ඩිස්ක් | සංඛ්‍යාව 900 |
| VCD ඩිස්ක් | සංඛ්‍යාව 309 |

(ඉ) 2009 / 2010 වර්ෂය සඳහා කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී වටිනා සංගීත හා නැටුම් උපකරණ 102 ක සංඛ්‍යාවක ඌනතාවයක් වාර්තා වී තිබුණි. කෙසේ වුවද ඌනතාවයන් සඳහා වගකීම පැවරීමට හා පාඩු අයකර ගැනීමට විධිමත්ව කටයුතු කිරීමට කළමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

2010 - 2015 කාල පරිච්ඡේදය සඳහා ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජුනි 02 දිනැති අංක පීඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව එහි ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැය ගත වියදම හා තථ්‍ය වියදම අතර විශාල විචලනයන් නිරීක්ෂණය වුයෙන් , අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ප්‍රසම්පාදන

(ඇ) මුල්‍ය කළමනාකරණය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති